**දික්වැල්ල ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව  වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින්  2023 දෙසැම්බර් 31 දිනට දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව  මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවන ලද රු.118,090 ක ණය වාරික හා පොලිය වෙනුවෙන් විවිධ ණයහිමි යටතේ ප්‍රතිපාදන සලස්වා තිබුණු සනත් ජයසූරියගම ග්‍රාමීය අත්පන්දු ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු.147,000 සඳහා ණයගැති ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගතකිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ආ) | සභාව සතුව භෞතිකව නොතිබූ වටිනාකම රු.4,494,435 ක් වූ බැකෝ යන්ත්‍රයක් , යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ වැඩියෙන් ගිණුම් ගත කර තිබුණ අතර වටිනාකම රු.100,000 ක් වූ රුක්අත්තනගහහේන ඉඩම, ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ඇ) | ඉකුත් වර්ෂවලදී මෝටර් රථ හා කරත්ත අලුත්වැඩියාව සඳහා දරන ලද රු.3,243,435 ක් මෝටර් රථ හා කරත්ත යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ඈ) | ලැබිය යුතු කර්මාන්ත ණයගැති රු. 364,443 ක ශේෂයක් හා කර්මාන්ත 03 කට අදාළව ගෙවිය යුතු රු.452,356 ක ශේෂයක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.1,988,648 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලයට අදාළ හිඟ දායකත්වය මුදල් සඳහා පමණක් ණය හිමි ප්‍රතිපාදන ඇති කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ඊ) | 2019 වර්ෂයේදී වසා දමා තිබූ ඉතිරි කිරීමේ ගිණුමක ශේෂය රු.360,340 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ හා වටිනාකම රු.1,391,977 ක් වූ ඉන්වෙන්ට්‍රි ස්වරූපයේ අයිතම 261 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛණ/උපලේඛණවල දැක්වෙන ශේෂයන් අතර රු.222,845,934 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.114,027 ක් වූ ගිණුම් විෂයයක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මු.රෙ. 772 (1) | භාවිතයෙන් ඉවත් කරන ලද හා අබලි භාණ්ඩ අයිතම 12 කට අදාළව ඒකක 116 ක් පොදු ගබඩා පරිශ්‍රයේ ගබඩා කර තිබුණු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කර දැමීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | අයිතම 08 ක් ඉවත් කර ඇති බවත්, ඉතිරි අයිතම 2024 සමීක්ෂණයෙන් පසු වෙන්දේසි කිරීමට හෝ විනාශ කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.66,721,653ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.45,788,643 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 9,050,000 | 13,187,823 | 11,809,409 | 4,050,616 | 7,847,400 | 4,069,966 | 3,571,612 | 2,672,202 |
| (ii) | කුලී | 8,750,000 | 9,806,191 | 10,211,861 | 1,054,005 | 8,036,590 | 4,200,221 | 3,887,151 | 1,459,675 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,022,000 | 1,629,910 | 1,629,910 | - | 2,392,000 | 559,750 | 559,750 | - |
| (iv) | වෙනත් ආදායම් | 24,950,000 | 21,595,198 | 21,759,358 | - | 6,857,000 | 20,223,707 | 20,141,627 | 164,160 |
| | | 45,772,000 | 46,219,122 | 45,410,538 | 5,104,621 | 25,132,990 | 29,053,644 | 28,160,140 | 4,296,037 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.3,902,720 ක් වූ අතර, වරිපනම් ඒකක 4190 කට අදාළව බිල් කිරීම් රු.3,184,493 ක් සමඟ රු.7,087,213 ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම රු.2,916,741 ක් වීම නිසා වර්ෂය අවසානයට වරිපනම් ඒකක 3191 කට අදාළව රු.4,170,472 ක හිඟ ශේෂයක් පැවතුණි. | 2024 පළමු කාර්තුව තුළ රු.622,800 ක මුදලක් අයකර ගත් බවත්, ඉතිරි හිඟ මුදල් අය කර ගැනීමට ජංගම සේවයක් ආරම්භ කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | සභාව සතු කඩ කුලී ගෙවන කඩ කාමර 117 ක් පැවති අතර ඉන් කඩ කාමර 72 කින් රු. 861,270 ක හිඟ ආදායමක් අයවිය යුතුව පැවතුණි. ඉන් කඩ කාමර 02 කට අදාළව රු.100,000 ට වැඩි හිඟ ශේෂයක් පැවති අතර වෙළෙඳ සංකීර්ණ තුනක කඩ කාමර 21 ක් භාවිතයට නොගෙන වසා දමා තිබුණි. | රු.100,000 ට වැඩි හිඟ ශේෂ පැවති කඩ කාමර 02 න් රු.37,640 බැගින් තව දුරටත් අයවීමට ඇති බව හා වසා දමා ඇති කඩ කාමරවලින් 06 ක් විවෘත කර ඇති බව. | හිඟ ආදායම් අයකිරීම හා කඩ බදු දීම කඩිනමින් කර ගත යුතුය. |
| (ඇ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපස/පපාකො/2010/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව වෙළෙඳ සංකීර්ණ දෙකක කඩ කාමර 20 ක කඩ කුලී තක්සේරුව යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණ අතර එම චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව කඩ කාමර 03 ක් බදු දීමේදී අයකළ යුතු එක්වන් මුදලින් රු.102,500 ක් අයකර ගෙන නොතිබුණි. | වලස්ගල පොදු වෙළෙඳ පොළ කඩ කාමර 05 සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇති බව හා එක්වන් මුදල් සඳහා අවසන් නිවේදනය බදුකරු වෙත යොමු කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් උසාවි දඩ වෙනුවෙන් රු.1,825,000 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.60,588,464 ක් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ වෙනුවෙන් රු.1,814,172 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.22,585,828 ක මුදලක් 2024 අප්‍රේල් 30 වන විට ලැබී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිරන කසළ එක්රැස් කර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සිදු නොකර ඒවා මාසික කුලී පදනම මත ලබාගත් පෞද්ගලික ඉඩමක් වෙත බැහැර කෙරුණි. | කොම්පෝස්ට් ව්‍යාපෘතියට සුදුසු ඉඩමක් තෝරා ගෙන ඇති බවත්, ඒ සඳහා පරිසර නිර්දේශය ලබා ගැනීමෙන් පසු විධිමත් කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව | විධිමත් කසළ කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව සභාවේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 48 න් කොට්ඨාශ 06කට අදාළව මාර්ග, බෝක්කු හා පාලම් හඳුනාගෙන මැනුම් කටයුතු අවසන් කර තිබුණ ද එම මාර්ග සිතියම්ගත කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | මේ වන විට වසම් 30ක් පමණ සිතියම් ගත කර අවසන් වී ඇති බවත්, ඉතිරි වසම් 18 කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 212 ප්‍රකාරව වැඩ සටහන් 03 ක් වෙනුවෙන් රු.322,707 ක් වැය කර මිලදී ගනු ලැබූ ද්‍රව්‍ය ලේඛනගත කර නොතිබුණි. | අතපසුවීමකින් ගබඩා ලැබීම් ලේඛනයට ඇතුළත් කිරීමට නොහැකි වූ බවත්, ඉදිරියේදී එවැනි අතපසු වීම් සිදු නොවීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 180 විධිවිධාන වලින් බැහැරව සභාවේ කාර්යාල කාර්ය සහායක සේවකයෙකුට 2021 මාර්තු 04 දින සිට දික්වැල්ල සති පොළෙහි බදු මුදල් එකතු කිරීමේ | ආදායම් පරීක්ෂකවරයාගේ සහාය සඳහා කාර්යාල කාර්ය සහයකයෙකු යොදවා ඇති බවත්, මහජන | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රාජකාරිය වෙනුවෙන් රු.126,500 ක කොමිස් මුදලක් ගෙවා තිබුණි. | පොළ බදු කොමිස් මුදල් ගෙවීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර ඇති ලිපිය ප්‍රකාරව කටයුතු කරන බව. | |
| (ඇ) | සභාවේ සේවයේ නියුතු ප්‍රාථමික ශ්‍රේණියේ කම්කරුවන් 09 දෙනෙකු වෙත තනතුරට අදාළ නියමිත රාජකාරි පැවරීමකින් තොරව රාජකාරි පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව රු.4,157,574 ක මුදලක් සභා අරමුදලින් වැයකර තිබුණි. | නියමිත තනතුරුවලට අදාළ නියමිත රාජකාරී වල යෙදවීමට කටයුතු කරන බව. | තනතුරට අදාළ නියමිත රාජකාරි පැවරිය යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපන ශාලා සහ නවාතැන්පොල 20 කින් 2019 සිට 2023 වර්ෂ සඳහා අයකළ යුතු සියයට 1 බලපත්‍ර ගාස්තුව විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 13 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සභා බලප්‍රදේශයේ පිහිටි හෝටල් 8 කින් 2019 වර්ෂයේ සිට 2023 දක්වා කාල පරිච්ඡේදයට අදාළව සියයට 1 ගාස්තු රු.890,226 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි. | අයකර ගත යුතු සියයට 1 බදු මුදල් අයකර ගැනීම සඳහා අදාළ ආයතන වෙත ලිපි නිකුත් කර ඇති බවත් ආයතන 19ක් විසින් බදු මුදල් ගෙවීම් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 28(1) වගන්තියේ විධිවිධාන වලින් බැහැරව අළුතින් ඉදිකර තිබූ හෝ ඉදිකරමින් පැවති ගොඩනැගිලි 08 ක් සඳහා සංවර්ධන බලපත්‍ර ලබා ගෙන නොතිබුණු අතර ගැසට් නිවේදනයේ 2 වන උපලේඛනය ප්‍රකාරව සැලසුම් අනුමත කිරීම ප්‍රතික්ෂේප කර තිබූ එහෙත් ඉදිකිරීම් කර තිබූ ගොඩනැගිලි අයදුම්පත් 03 ක් වෙනුවෙන් රු.1,187,570 ක ගාස්තු අයකර එම ඉදිකිරීම් විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් නීත්‍යානුකූල කර ගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇති බව හා ගොඩනැගිලි සැලස්ම් සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කර අදාළ අනුමත ආවරණ ගාස්තු අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2020 ජුලි මස අනුමැතිය ලබාදී තිබුණු ගොඩනැගිලි සැලැස්මට අනුකූල නොවන පරිදි වර්ග මීටර් 172.4 ක ප්‍රමාණයකින් යුතු ගොඩනැගිලි 02 ක් හා වර්ග මීටර් 20.25 ක් වූ දැවමය හට් එකක් සහ දිග මීටර් 17 ක මායිම් තාප්පයක් ද ඉදිකර තිබුණි. උක්ත ඉදිකිරීම් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා අදාළ දඩ ගාස්තු අය කර විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කර අදාළ අනුමත ආවරණ ගාස්තු අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දික්වැල්ල අළුත්ගොඩ දඹගස්ආර පිහිටි නාරංගහහේන අනුබෙදුම් කළ ඉඩම සඳහා සභාවේ සැලසුම් කමිටුව විසින් නිකුත් කරනු ලබන සංවර්ධන බලපත්‍රයේ සඳහන් කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් තොරව කැබලි 27 ක් විකුණා තිබුණ ද ඒ මත අයකළ යුතු සියයට 1 ක ගාස්තුව සභාව වෙත අයකරගෙන නොතිබුණි. | අදාළ කොන්දේසි සම්පූර්ණ කළ පසු ඉඩම් අනුබෙදුම් සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීමේදී අනුමත ආවරණ ගාස්තු අය කර ගැනීමටත්, සියයට 1 ගාස්තුව අය කර ගැනීමටත් කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | බඹරැන්ද පිහිටි වන්නිගෙවත්ත, කට්ටඩිගෙවත්ත, මැදගොඩවත්ත, මීකන්දෙආරේ කොරටුව නැමති ඉඩම කැබැලි 16 කට (මාර්ග හා කාණු හැර) අනුබෙදුම් කර විකිණීම සඳහා සංවර්ධන අවසර පත්‍රය මඟින් පනවා තිබූ කොන්දේසි ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමටත් ප්‍රථම එනම් 2021 අගෝස්තු 09 දින සිවිල් ඉංජිනේරු වාර්තාව ඉදිරිපත් කර තිබුණු අතර, ඒ අනුව නිසි සොයා බැලීමකින් තොරව ව්‍යාජ වරලත් සිවිල් ඉංජිනේරු වාර්තා ලබා ගන්නා බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2021 අගෝස්තු 04 දින තාක්ෂණ සේවා නිලධාරී ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කළ බවත්,එහිදී අදාළ මාර්ග හා කාණු පද්ධතිය සංවර්ධනය කර ඇති බව නිරීක්ෂණය වූ බවත්, ඒ පිළිබඳව වෙන්දේසිකරුගෙන් විමසීමේදී කොරෝනා කාලය තුළ ඉදිකිරීම් කටයුතු සිදු කළ බව ප්‍රකාශ කළ බවත්, ඊට අදාළ වරලත් ඉංජිනේරු වාර්තාව සභාවට ඉදිරිපත් කළ බව ප්‍රකාශ කළ බව. | නිවැරදි වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | කැබලි 16 කට වෙන් කරන ලද ලියන පතිරණගෙගෙදරවත්ත නමැති ඉඩම කැබලි කිරීමට පෙර ඉටු කළ යුතු කොන්දේසි ඇතුළත් සංවර්ධන අවසර පත්‍රයේ අංක 8 හා 10 කොන්දේසි වලින් බැහැරව 2023 දෙසැම්බර් 13 දින වන විට අනුකූලතා සහතිකය ලබා ගැනීමෙන් තොරව කැබලි 14 ක් විකුණා තිබූ අතර කැබලි 03 ක නේවාසික ගොඩනැගිලි 03 ක් ද ඉදිකරමින් පැවතුණි. | 2021 දෙසැම්බර් 21 දිනැති සැලසුම් කමිටුවේ තීරණ අංක 09 හා 10 යටතේ ඉඩම් අනුබෙදුම් අංක SD/2020/226 හා SD/2020/227 සඳහා අනුකූලතා සහතිකය ලබා ගෙන ඇති බව. | කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------- | ----------- |
| (අ) | පළාත් කළමනාකරණ සේවා නිලධාරින්ගේ සංගමය විසින් වාර්ෂිකව පවත්වනු ලබන සම්මේලනය සඳහා සභාවේ නිලධාරීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් 2022 හා | දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මඟින් අනුමැතිය ලැබී ඇති බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2023 වර්ෂවලදී රු. 203,200 ක් බාහිර පාර්ශවයක් වෙත සහා අරමුදලින් ගෙවා තිබුණි. | | |
| (ආ) | මාර්ග නාම පුවරු සකසා සවි කිරීම සඳහා අවිධිමත් ලෙස ව්‍යාපාර 09 කින් රු.342,000 ක මුදලක් ලබාගෙන තිබුණු බව නියැදි විගණන පරික්ෂාවේදී නිරීක්ෂණය විය. එම මුදල් රැස්කිරීම සඳහා විධිමත් සැලැස්මක්, ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හා ගිණුම්කරණ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | අදාළ ආයතන විසින් වියදම් දරා සභාවෙන් ලබා දුන් පිරිවිතර අනුව මාර්ග නාම පුවරු සකස් කර පරිත්‍යාග ලෙස ලිඛිතව ලබා දීම සිදු කර ඇති බවත්, පරිත්‍යාගය සඳහා ස්තූතිය ප්‍රකාශ කර ලිපි නිකුත් කර ඇති බව. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |
| (ඇ) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන වලින් බැහැරව සහා අරමුදලින් රු.1,316,723 ක් වටිනා කොන්ත්‍රාත් 02 ක් අනුමත සමිතියකට පවරන බව හඟවමින් හා සේවකයෙකු විසින් ඉටුකර රු.1,045,230 ක් ලබාගෙන තිබූ අතර තවත් රු.2,777,087 ක කොන්ත්‍රාත් 02 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණි. | ප්‍රජා සංවර්ධන සමිති විසින් කොන්ත්‍රාත්තු වෙනත් අයෙකුට පැවරීමට ලිඛිතව ඉල්ලීම් කර නොමැති බවත්, මේ වනවිට ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත් පිරිනැමීමට පියවර ගෙන ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | රු.6,500,673 ක ඇස්තමේන්තු වටිනාකමින් යුත් ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා 1988 (මූල්‍ය හා පරිපාලන) රීති 177 හා 178, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මාලාව සහ 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන වලින් බැහැරව අනුමත සමිති වලින් පමණක් ටෙන්ඩර් කැඳවා තිබුණි. | පිළිගත් සමිති වෙතින් පමණක් මිල ගණන් කැඳවන ලද සියලු ටෙන්ඩර් අවලංගු කරන ලද බවත්, 2024 වර්ෂයට අදාළව ටෙන්ඩර්කරුවන් ලියාපදිංචි වීමෙන් පසුව ටෙන්ඩර් කැඳවීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව. | නෛතික විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 ප්‍රකාරව අවම මිල ගණන් මත පදනම්ව ආයතනය තෝරා ගැනීමෙන් තොරව ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනකට සහභාගී වූ නිලධාරීන්ට අවශ්‍ය ශාලා පහසුකම් හා ආහාරපාන ලබා ගැනීම වෙනුවෙන් එකතුව රු.144,500 ක මුදලක් සහා අරමුදලින් වැය කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි මුදල් ගෙවා සිදු කරන පුහුණු වැඩමුළු සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අවම මිල ගණන් මත පදනම්ව ආයතනය තෝරා කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ සේවයේ නියුතු ප්‍රාථමික ශ්‍රේණියේ කම්කරුවන් 09 දෙනෙකු වෙත තනතුරට අදාළ නියමිත රාජකාරි පැවරීමකින් තොරව රාජකාරි පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව රු.4,157,574 ක මුදලක් සභා අරමුදලින් වැයකර තිබුණි. | නියමිත තනතුරුවලට අදාළ නියමිත රාජකාරී වල යෙදවීමට කටයුතු කරන බව. | තනතුරට අදාළ නියමිත රාජකාරි පැවරිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ සේවය කළ, ස්ථාන මාරුවී ගිය, සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා මියගිය සේවකයින් 09 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 808,086 ක ණය ශේෂය වසර ගණනාවක සිට අය නොවී පැවතුණි. | මේ වන විට කිහිපදෙනෙකුගේ ණය ශේෂයන් පියවා ගෙන ඇති බවත්, අනෙකුත් ණය ශේෂයන් ඉදිරියේදී පියවා ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් අය කර ගත යුතුය. |